මධ්‍යම පළාතේ
ප්‍රධාන ලේකම් කාර්යාලය
04-3-1991
මහනුවර.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 642/18—1990 දෙසැම්බර් 28 වැනි සිකුරාදා—1990.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස—පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා කුමසම්පාදන ඉඩම්, ජලකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් 1990 අංක 17 දරන මුද්‍රල් ප්‍රඥප්තියේ 37 දරන වගන්තිය සමග කියවෙන එම ප්‍රඥප්තියේ 77 (1) (අ) දරන වගන්තිය යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසිය.

ඩබ්. බී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා කුමසම්පාදන ඉඩම් ජලකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 දින,
මහනුවර දීය.

රෙගුලාසි

(අ) මෙහි ඇති උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් සෑම ලේඛනයක්ම සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් අනුව ;

සහ

(ආ) මෙහි ඇති උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් සෑම ලියවිල්ලක්ම සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් අනුව

1991 ජනවාරි 1 වන දින සිට මුද්දර ගාස්තු අය කළ යුතුවේ.

උපලේඛනය

| | I වන තීරය | II වන තීරය රු. ශත |
|---|---|---|
| විෂය අංක | | |
| 1. | (1) සම උරුම්කාරයන් අතර හාර, යම් දේපළක් හුවමාරු කිරීම සඳහා වූ ඔප්පුවක් හෝ ලේඛනයක්— | |
| | (i) (අ) සමාන වටිනාකමින් යුතුවේ නම්, දේපල පිළිබඳව වෙළඳපොලෙහි පවත්නා වටිනාකමට පවරනු ලබන දේපලක් සම්බන්ධයෙන් අයත් ගාස්තුවම ; | |
| | (i) (ආ) සමාන නොවන වටිනාකමින් යුතු වේ නම් වඩා ඉහළ වටිනාකමින් යුත් දේපල පවරා දීමේදී මෙන්ම වෙළඳපොලෙහි පවත්නා එහි වටිනාකමට අනුකූලවන්නා වූ ගාස්තුවම; | |
| | (ii) සම උරුමක්කාරයන් අතර යම් දේපලක් හුවමාරු කිරීම සඳහා වූ ඔප්පුවක් හෝ ලේඛනයක්— | |
| | (අ) සමාන වටිනාකමින් යුතු වේ නම් ... ... ... ... ... | 10 0 |
| | (ආ) සමානකම සඳහා මුදල් පිළිබඳ සැලකිල්ලක් දක්වනු ලැබේ නම්, හුවමාරු කරගනු ලබන දේපල පිළිබඳ වෙළඳපොලේ වටිනාකමවලට වෙනසට සමාන වන මුදලි එම දේපල හුවමාරු කිරීමේදී අදාළවන ගාස්තුවම | |

| විෂය අංක | I වන තීරය | II වන තීරය රු. ශ. |
|---|---|---|
| 2. | නඩුගයක් හෝ යම් දේපලක් පිළිබඳ තැගි ඔප්පුවක් — | 5 0 |
| | (අ) දේපලෙහි වටිනාකම රු. 50,000ක් හෝ ඊට වඩා අඩු නම්, සෑම රු. 100ක් හෝ ඉන් කොටසක් සඳහා ... | 1,500 0 |
| | (ආ) දේපලෙහි වටිනාකම රු. 50,000 ට වඩා වැඩි නම්, පළමු. රු. 50,000 සඳහා ... | 2 0 |
| | වටිනාකම රු. 50,000 ට වැඩි සෑම රු. 100 ක්ම සඳහා ... | |
| 3. | (අ) තැගි දීමකින් හැර මියගිය තැනැත්තකුගේ දේපල පිළිබඳ බලකාරයෙකු හෝ අද්මිනිස්ත්‍රාත්කරුවකුගේ සැලකිල්ලක් නොමැතිව එම දේපල වලට අයිතිලාභියකු වශයෙන් හිමිකම් තිබෙන පුද්ගලයෙකුට හෝ මියගිය තැනැත්තාගේ කැමැත්ත පරිදි පත් කරන ලද භාරකාරයෙකුට යම් නිශ්චල දේපලක් පවරාදීම හෝ හිමිකරදීම හෝ භාරකාරයෙකු විසින් අයිතිලාභියකුට හෝ උසාවියේ නියෝගයකින් විභාගයකට අදාළ නඩු විභාගයකදී පවරාදීම හෝ හිමිකරදීම - | 3 0 |
| | (I) රු. 1,00,000 ට නොවැඩි වටිනාකමකින් යුතුවන විට, එම වටිනාකමෙහි සෑම රු. 100 ක් සඳහා ... | 4 0 |
| | (II) වටිනාකම රු. 1,00,000 ට වැඩිවන විට රු. 100 ක් හෝ ඉන් කොටසකට ... | |
| | (ආ) තැගි දීමකින් හැර මියගිය තැනැත්තකුගේ දේපල පිළිබඳ බලකාරයෙකු හෝ අද්මිනිස්ත්‍රාත්කරුවකුගේ සැලකිල්ලක් නොමැතිව එම දේපල වලට අයිතිලාභියකු වශයෙන් හිමිකම් තිබෙන පුද්ගලයෙකුට හෝ මියගිය තැනැත්තාගේ කැමැත්ත පරිදි පත් කරන ලද භාරකාරයෙකුට යම් චංචල දේපලක් පවරාදීම හෝ හිමිකරදීම හෝ භාරකාරයෙකු විසින් අයිතිලාභියකුට හෝ උසාවියේ නියෝගයකින් විභාගයකට අදාළ නඩු විභාගයකදී පවරා දීම හෝ හිමිකර දීම - | 3 0 |
| | වටිනාකමෙහි සෑම රු. 100 ක් හෝ ඉන් කොටසක් සඳහා ... | |
| 4. | ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ අද්මිරාල්ටි අධිකරණ බලය ක්‍රියාවේ යොදවන විටකදී මහාධිකරණයක හෝ සිවිල් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරනු ලබන එක් එක් ලියවිල්ලක් සඳහා - | 2 0 |
| | (අ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී සෑම රු. 1,000 හෝ ඉන් කොටසකට ... | 2,000 |
| | (ආ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී ... | |
| 5. | දිස්ත්‍රික් උසාවියක සිවිල් නීති කෘත්‍යයක් සඳහා ඉදිරිපත් කරනු ලබන එක් එක් ලියවිල්ලක් සඳහා — | 1 0 |
| | (අ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 නොඉක්මවන විටකදී, එක් එක් රු. 1,000 හෝ ඉන් කොටසකට ... | 1,000 0 |
| | (ආ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී ... | |

ඩබ්. ඩී. එම්. පී. බී. දිසානායක,
බස්නාහිර පළාත් පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉඩම් සංවර්ධන, ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ලේ දීය.

01—183/1

---

**1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය — බස්නාහිර පළාත් පළාත් සභාව 8(1) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාත් පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 8 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති [illegible] බස්නාහිර පළාත් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම්, සංවර්ධන, ප්‍රාදේශීය [illegible] කටයුතු පිළිබඳ ඇමති විරසූරිය දිසානායක මුදියන්සේලාගේ ප්‍රබ්. බංඩා දිසානායක වන මා මෙම නියෝගය මගින් පහත සඳහන් [illegible] සිට පිරිවැයුම් බද්දෙන් නිදහස් කරමි.

(අ) යම් නිෂ්පාදිත හෝ සකස් කළ ද්‍රව්‍යයක් අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපාරයක්.

(ආ) වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යම් දෙපාර්තමේන්තුවක් හැර වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවක්.

(ඇ) යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක්.

ඩබ්. ඩී. එම්. පී. බී. දිසානායක,
බස්නාහිර පළාත් පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම් සංවර්ධන, ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 දින,
බත්තරමුල්ලේ දීය.

01-183/2

### 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය—මධ්‍යම පළාතේ පළාත් සභාව

### 76 (1) වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 76 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉඩම්, ජේෂකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැති වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බංඩා දිසානායක වන මම එම ප්‍රඥප්තියේ 87 (අ), (ආ) සහ (ඉ) දරන වගන්ති වල සඳහන් ලේඛන සහ ලියකියවිලි පිළිබඳ මුද්දර ගාස්තු ගෙවීම සඳහා මෙම නියෝගයෙහි විස්තර කෙරෙන අලවන මුද්දර 1991 ජනවාරි 01 වෙනි දිනසිට පාවිච්චි කරන ලෙස ප්‍රකාශ කරමි.

සී.පී.පී.සී. යන ඉංග්‍රීසි අකුරු මතුපිට මුද්‍රණය කරනු ලැබ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් දැනට මත් නිකුත් කොට තිබෙන රුපියල් 50 (පනහ) රුපියල් 100 (සියය) රුපියල් 500 (පන්සියය) සහ රුපියල් 1,000 (දහ) යන වටිනාකමින් යුත් අලවන මුද්දර.

ඩබ්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ
නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉඩම්, ජේෂකර්මාන්ත,
ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 වැනි දින,
මහනුවරදී ය.

01–183/3

---

### 1990 අංක [illegible] දරන මුදල් ප්‍රඥප්තිය—මධ්‍යම පළාතේ පළාත් සභාව

### 96 (1) වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 96 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉඩම්, ජේෂකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බංඩා දිසානායක වන මම 1991 ජනවාරි මස 1 වන දින සිට සියයට 5 ක බද්දක් මෙම නියෝගය මගින් නියම කරමි.

ඩබ්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ
නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉඩම් ජේෂකර්මාන්ත
ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 වැනිදින,
මහනුවරදී ය.

01–183/4

---

### 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය—මධ්‍යම පළාතේ පළාත් සභාව

### 8 වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 8 දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම්, ජේෂකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලනය, හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බංඩා දිසානායක වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ද්‍රව්‍ය 1991 ජනවාරි 01 දින සිට නිදහස් කළ ද්‍රව්‍ය වශයෙන් ප්‍රකාශ කරමි.

(අ) පොත් (සඟරා, වාර සඟරා සහ ප්‍රවෘත්ති පත්‍ර හැර)
(ආ) පාන්
(ඇ) කරදමුංගු
(ඈ) කරාබුනැටි
(ඉ) කුරුඳු
(ඊ) ඉබෝතල සහ ගුවන් තැපැල් ලේඛන
(උ) බෙහෙත් ද්‍රව්‍ය
(ඌ) අමු තේ දළු
(එ) සාදික්කා
(ඒ) වියළි හැඳපාල් කිරි
(ඔ) ගම්මිරිස්
(ඕ) රබර්
(ක) විදේශ තානාපති දූත මණ්ඩල වලට සහ එම දූත මණ්ඩල වල තානාපති කාර්ය මණ්ඩල සාමාජිකයන්ට විකුණනු ලබන පැට්‍රල්.
(ඛ) ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් හෝ යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් විකුණනු ලබන ජලය.
(ග) විදේශීය මුදල් මගින් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙනු ලැබූ යම් පුද්ගලයකු විසින් විදේශීය මුදලින් ගෙවීම සඳහා විකුණනු ලබන ස්වර්ණාභරණ සහ මැණික්.

ඩබ්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය
සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම්,
ජේෂකර්මාන්තය, ප්‍රාදේශීය පරිපාලනය සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 වැනි දින,
මහනුවරදී ය.

01—183/5

## 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය—මධ්‍යම පළාතේ පළාත් සභාව

7 (1) වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 7 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම්, ජේෂකර්මාන්ත, ප්‍රාදේශීය පරිපාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම පහත සඳහන් පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් මෙම නියෝගය මගින් 1991 ජනවාරි මස 1 වන දින සිට නියම කරමි.

(අ) මැණික් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 05

(ආ) ඉරන ලද ලී හෝ ලී කොට වශයෙන් දව විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 05

(ඉ) වටිනා හෝ අර්ධ වශයෙන් වටිනා ගල් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 05

(ඊ) රත්‍රං විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 05

(උ) ලී බඩු විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 05

(ඌ) ස්වර්ණාභරණ සහ ඇඳුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 10

(එ) ඉහත (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ වෙළඳ ද්‍රව්‍යයන් මිළදී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්—සියයට 01

ඩබ්. බී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ
නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, ඉඩම් ජේෂකර්මාන්ත
ප්‍රාදේශීය පරිපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 28 වැනි දින,
මහනුවර දී ය.

01—183/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී